## දෘශ්‍ය කලා පීඨය සඳහා සිසුන් බඳවා ගැනීමේ යෝග්‍යතා පරීක්ෂණය -2026

උක්ත පරීක්ෂණයේ දී අපේක්ෂක අපේක්ෂිකාවන්ට ලකුණු ලැබෙනුයේ පරීක්ෂණ මණ්ඩල 03න් දෙනු ලබන ලකුණුවල එකතුවක් ලෙස ය. එක් එක් මණ්ඩලයේ පරීක්ෂකවරුන් විසින් තනි තනිව සිය ලකුණු ලැයිස්තු ස්වාධීනව ලබාදෙනු ඇත. විශ්වවිද්‍යාල අභ්‍යන්තරයෙන් මෙන්ම බාහිර විෂය ප්‍රවීණයන්ගෙන්ද මෙම පරීක්ෂණ මණ්ඩල සමන්විත වේ. පරීක්ෂණ මණ්ඩලය සාමූහිකව සාකච්ඡා කොට ලකුණු ලබාදීම සපුරා තහනම් වේ. එසේ තනි තනිව ලකුණු ලබාදෙන පරීක්ෂකවරුන්ගේ සංඛ්‍යාව 21කි. එක් අපේක්ෂකයකුගේ සමස්ත ලකුණ සකස් වනුයේ ඉහත දක්වන ලද පරීක්ෂකයින් 21 දෙනා ඇතුළත් මණ්ඩල තුනක ලකුණුවල එකතුවෙහි සමස්තය ගණනය කිරීමෙනි. විනිවිදභාවය සහතික කිරීම, බලපෑම් කිරීමට ඇති අවකාශය ඉවත් කිරීම හා අපේක්ෂක අපේක්ෂිකාවන්ට ඉහළම සාධාරණයක් ඉෂ්ට කිරීම පිණිස මෙම ක්‍රමවේදය පීඨය විසින් අනුගමනය කරනු ලැබේ.

### (1) පළමු පරීක්ෂණය

(ඇඳීම) මානව දේහය ඇඳීම - පැන්සල් හෝ චාකෝල් මාධ්‍ය භාවිතයෙන් මානව දේහය ඇඳීම.

**ඇගයීමේ නිර්ණායක**

i. ලබා දී ඇති සමස්ත කඩදාසියට ගැළපෙන පරිදි සංරචනය කිරීම.
ii. මානව දේහය රේඛා මඟින් ගුණාත්මකව ග්‍රහණය කිරීම.
iii. මානව දේහයේ ත්‍රිමාන ගුණය විදහා දැක්වීම.
iv. මානව දේහයේ අනුපාතයන් හා පරිමාණයන් ගැළපෙන පරිදි ඉදිරිපත් කර තිබීම.
v. සමස්ත නිමාව

*(කාලය පැය 03, ලකුණු 45 යි.)*

### (2) දෙවන පරීක්ෂණය

ලබාදෙන ලද ප්‍රශ්න අතුරින් එක් ප්‍රශ්නයක් පමණක් තෝරාගෙන නිර්මාණයක් ඉදිරිපත් කළ යුතුය.

මෙහිදී ලබා දෙන ලද ප්‍රශ්න අතුරින් එක් ප්‍රශ්නයක් තෝරාගෙන වර්ණ/වෙනත් අදාළ මාධ්‍ය භාවිතා කරමින් නිර්මාණාත්මකව ඉදිරිපත් කිරීම අපේක්ෂා කෙරේ.

**ඇගයීමේ නිර්ණායක**

i. ගැටලු විසඳීමේ හැකියාව (Problem Solving) නිර්මාණශීලිව තීරණ ගැනීමේ හැකියාව හඳුනාගැනීම.
(අපේක්ෂිත ප්‍රතිඵල සඳහා පර්යේෂණාත්මකව, විශ්ලේෂණාත්මකව,තීරණ ගැනීමේ හැකියාව)
ii. නව දැකීමකින්, වෙනත් මුහුණුවරකින් නිර්මාණශීලි ප්‍රවේශයක් ලබා ගැනීම.
iii. ද්‍රව්‍ය, මාධ්‍ය භාවිතය හා ඉදිරිපත් කිරීමේ විශේෂතා
iv. නව මාධ්‍ය, තාක්ෂණය හා කලාත්මක උපයෝගීතාව

*(කාලය පැය 02 විනාඩි 30, ලකුණු 45යි.)*

**(1)තෙවන පරීක්ෂණය**

**කලා රචනය**

ලබා දී ඇති ප්‍රශ්න දෙක අතුරින් එකකට (01) පමණක් පිළිතුරු සපයන්න. (අවම වචන සීමාව 300කි.)

1. ප්‍රශ්න අංක 02 (දෙවන පරීක්ෂණය) යටතේ ඔබ කරන ලද නිර්මාණය පිළිබඳව කෙටි ඇගයීමක් කරන්න. (භාවිත කළ වර්ණ, රේඛා, හැඩ, සංරචනය, සංකේත භාවිතය, ඔබට බල පෑ කලාකරුවන් හෝ කලා ව්‍යාපාර ආදිය ඇතුළත්)

   හෝ

2. ඔබ කැමති ඕනෑම කලාකරුවෙකුගේ තෝරාගත් එක් නිර්මාණයක් පිළිබඳව රචනයක් ලියන්න.

**ඇගයීමේ නිර්ණායක**

නිර්මාණයට අදාළ,

i. ස්වතන්ත්‍ර නිර්මාණයක් හෝ වෙනත් කලා කරුවෙකුගේ කලා කෘතියක් පිළිබඳව විචාරාත්මකව අදහස් දැක්වීම.

ii. කලා ලක්ෂණ පිළිබඳ සංවේදීතාව

iii. සංකල්ප පිළිබඳ අවධානය

iv. භාෂා භාවිතයෙන් නිරවුල්ව අදහස් දැක්වීම

*(කාලය පැය 1/2 (විනාඩි 30), ලකුණු 10 යි.)*

**දෘශ්‍ය කලා පීඨයේ යෝග්‍යතා පරීක්ෂණය ඇගයීම් ක්‍රියාවලින් පරීක්ෂක මණ්ඩල තුනක් (03) යටතේ සිදුකරනු ලබයි.**

**<u>යෝග්‍යතා පරීක්‍ෂණයේ පරීක්‍ෂණ මණ්ඩල සංයුතිය</u>**

එක් එක් පරීක්‍ෂණ මණ්ඩල සඳහා වෙන වෙනම කණ්ඩායම් ඇතුළත් වේ.

**පළමු පරීක්‍ෂණ මණ්ඩලය (ප්‍රායෝගික) - ඇඳීම**

i අභ්‍යන්තර ආචාර්ය මණ්ඩලයේ සාමාජිකයින් - 07

ii බාහිර විෂය ප්‍රවීණයන් - 02

**(සම්පූර්ණ ගණන 09)**

**දෙවන පරීක්‍ෂණ මණ්ඩලය (ප්‍රායෝගික) - නිර්මාණාත්මක සංරචනය/සැලසුම්කරණය (මණ්ඩල තුනකින් සමන්විතය.)**

i අභ්‍යන්තර ආචාර්ය මණ්ඩලයේ සාමාජිකයින් - 06

ii බාහිර විෂය ප්‍රවීණයන් - 03

**(සම්පූර්ණ ගණන 09)**

**තෙවන පරීක්‍ෂණ මණ්ඩලය (ලිඛිත) - කලා රචනය**

i අභ්‍යන්තර ආචාර්ය මණ්ඩලයේ සාමාජිකයින් - 02

ii බාහිර විෂය ප්‍රවීණයෙක් - 01

**(සම්පූර්ණ ගණන 03)**

- අභියෝග්‍යතා පරීක්ෂණයට මුහුණදෙන සිසුන් ඉහත පරීක්ෂණ තුන සඳහාම සහභාගී විය යුතුයි.

**විශේෂ උපදෙස්**

සෑම දිනකම යෝග්‍යතා පරීක්ෂණය පැවැත්වෙන වේලාවන් පහත වගුවේ සඳහන් වේ.

| පරීක්ෂණය | වේලාව |
|---|---|
| පළමු පරීක්ෂණය - ඇඳීම | පෙ.ව.9.00 සිට මධ්‍යාහ්න.12.00 දක්වා |
| දෙවන පරීක්ෂණය - වරණීය ප්‍රශ්නය | ප.ව.1.00 සිට ප.ව.3.30 දක්වා |
| තෙවන පරීක්ෂණය - කලා රචනය | ප.ව.3.30 සිට ප.ව. 4.00 දක්වා |
| | |

***උපදෙස් :*** *චිත්‍ර ඇඳීම සඳහා අවශ්‍ය කරනු ලබන කඩදාසි සහ ඇඳීමේ ආධාරක (Drawing Boards)* ***පමණක්*** *විශ්වවිද්‍යාලය මඟින් සපයනු ලැබේ.*
*දියසායම් හෝ පෝස්ටර් සායම් යනාදි වර්ණ ගැන්වීමට උචිත ඉක්මණින් වියළෙන මාධ්‍යයක් භාවිතා කළ යුතුය.*

ඉහත නිර්ණායක සහ ක්‍රමවේදය 2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.

පීඨාධිපති
දෘශ්‍ය කලා පීඨය

ආචාර්ය අයි. එම්. ටී. ඉලංගසිංහ
පීඨාධිපති - දෘශ්‍ය කලා පීඨය
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය